# පුරප්පාඩු දැන්වීමයි
## මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සහකාර ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින සහකාර ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා පත්කිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවයෙහි සේවයේ නියුතු ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගැනීමේ ක්‍රමය**

මධ්‍යම පළාත තුළ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ නිලධාරීන් නොමැති බැවින්, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත, මධ්‍යම පළාත තුළ සේවයේ නියුතු ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවා, සම්මුඛ පරීක්ෂණයක් පවත්වා ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය අනුව, ලැබෙන ලකුණු ප්‍රමුඛතාවය මත වඩාත්ම සුදුසු නිලධාරියා සහකාර ආයුර්වේද කොමසාරිස් තනතුරට පූර්ණ කාලීනව වැඩ බැලීමට පත්කරනු ලැබේ.

( අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා දේශීය වෛද්‍ය විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතයෙකුද ඇතුළත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.)

(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළකර ඇත)

**02. වෙනත් සුදුසුකම්**

I. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාව තුළ විනය කටයුත්තකට හෝ විනය දඬුවමකට භාජනය නොවූ අයෙකු විය යුතුය.

II. දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් වෙතින් පමණක් අයදුම්පත් කැඳවන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

III. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුයි.

සටහන: සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

**03. අයදුම්පත් ඉදිරිපත් කිරීම**

සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර **2024.04.10** වන දින හෝ ඊට පෙර ලැබෙන ලෙස මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව **" ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර "** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"සහකාර ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ.
(ආදර්ශ අයදුම්පත්‍ර www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය)

**04.** 2020.10.27 දිනැති අංක 2199/10 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ කොන්දේසි මෙම බඳවා ගැනීම සඳහා බල පවත්වනු ලැබේ.

**05.** මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සළසා නොමැති සියළුම කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කුමුදිනී එස්.ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2024.03.25 වැනි දින.
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය